# ඇඳුම් සේදීමේ දී සහ මැදීමේ දී විදුලිය ඉතිරි කරමු

## රෙදි සේදීම

රෙදි සේදීම සහ මැදීම කෙතරම් කාර්යබහුල දිවියක වුව ද ඉතා අත්‍යවශ්‍ය අංගයකි. තාක්ෂණයේ දියුණුවත් සමඟ ම වර්තමානයේ සෑම නිවසක ම පාහේ රෙදි සේදුම් යන්ත්‍ර දක්නට ලැබේ. ඔබ රෙදි සෝදන යන්ත්‍රය නිවැරදි ව භාවිත කිරීම සහ නඩත්තු කිරීම සිදු කරන්නේ ද යන්න මතත් කොපමණ වරක් භාවිත කරන්නේ ද යන්න මතත් පදනම් ව විදුලි බිලෙහි අඩු වැඩි වීම සිදු වේ. වාසනාවකට මෙන් ඔබට ඇඳුම් සේදීමේ දී විදුලිය ඉතිරි කර මුදල් ඉතිරි කරගැනීමට බොහෝ දේ කිරීමට අවස්ථාව තිබේ. මේවා ක්‍රියාත්මක කර ඔබේ විදුලි බිල්පතේ අඩු වීම අත්විඳින්න.

- **හැකි සෑම විට ම අතින් රෙදි සේදීමට යොමු වන්න. ඒ මඟින් අනවශ්‍ය ලෙස නිතර විදුලිය වැය වීමක් සිදු නො වනු ඇත.**
- **වරින් වර රෙදි සේදීමට වඩා අවශ්‍ය රෙදි එකතු කර එක වර සේදිය හැකි උපරිම බර ප්‍රමාණයට ගැළපෙන ලෙස රෙදි යන්ත්‍රයට ඇතුළු කර සේදීමට පුරුදු වන්න. රෙදි සෝදන යන්ත්‍රයක් අඩු රෙදි බරකට ද, එහි උපරිම ශක්තිය ම භාවිත කරයි. එය අවාසියකි.**
- **බොහෝ විට ජල මට්ටම් (Water level) එකකට වඩා ඇති රෙදි සෝදන යන්ත්‍රයක් භාවිත කරන්න. මන්ද, එවිට රෙදි සෝදන ප්‍රමාණයට අනුව ජල මට්ටම වෙනස් කළ හැකි බැවිනි.**
- **ජලය අඩුවෙන් භාවිත කරන රෙදි සේදුම් යන්ත්‍රයක් දිගු කාලීන ව පිරිමැසුම්දායක ය.**
- **ඇඳුම් සේදීමට අවශ්‍ය වන වාර ගණනක් ද ඔබට තීරණය කළ හැකි නම් එය තවත් වාසියකි.**
- **කෙටි වාර ප්‍රමාණයක් සඳහා අවශ්‍ය වන්නේ අඩු බලශක්තියකි. සේදීමට අවශ්‍ය වාර ප්‍රමාණය අනුව රෙදි වෙන් කරගන්න.**
- **රෙදි වියළීම යන්ත්‍රයේ ම සිදු නො කරන්න. මන්ද ඒ සඳහා සැලකිය යුතු ශක්තියක් වැය වේ. සෑම විට ම ස්වාභාවික සූර්ය රශ්මියෙන් රෙදි වියළීමට පුරුදු වන්න. එමඟින් රෙදි වියළීමට යන්ත්‍රයට වැය වන විදුලිය ඉතිරි වී විශාල විදුලි ඉතිරියක් ලබාගත හැකි වේ.**



### බලශක්ති කාර්යක්ෂම රෙදි සේදුම් යන්ත්‍රයක් මිල දී ගැනීමට අදාළ කරුණු කිහිපයක් පහත දැක්වේ

- **අර්ධ ස්වයංක්‍රීය සහ ස්වයංක්‍රීය යන්ත්‍ර 230 W - 725 Wක විදුලියක් භාවිත කරයි.**
- **ස්වයංක්‍රීය යන්ත්‍රයක් එය සම්පූර්ණයෙන් පිරී තිබුණත් අර්ධ වශයෙන් පිරී තිබුණත් මිනිත්තු 30 - 45ක මෙහෙයුම් කාලයක් අවසන් කර රෙදි කිලෝ 4.5-5ක් (4.5 kg - 5 kg) අතර ප්‍රමාණයක් සෝදයි.**
- **එහෙත් අර්ධ ස්වයංක්‍රීය යන්ත්‍රයක් මිනිත්තු 20ක කාලයක් ක්‍රියාත්මක වී කිලෝ 3-5ක (3 kg - 5 kg) රෙදි ප්‍රමාණයක් සෝදයි.**
- **ඉදිරිපසින් රෙදි දැමීමට හැකි (Front loading) රෙදි සෝදන යන්ත්‍රයක් මිල දී ගන්න. එහි ධාරිතාව වැඩි නිසා එක වර රෙදි විශාල ප්‍රමාණයක් සේදීමේ හැකියාව ඇත.**
- **කලතනය (Agitators) නොමැති රෙදි සෝදන යන්ත්‍රයක් තෝරාගන්න. මන්ද එවිට එක් වාරයක් සඳහා කලතනය භාවිත කරන යන්ත්‍ර විශාල බලශක්තියක් පරිභෝජනය කරයි.**
- **ඉහළින් රෙදි ඇතුළු කරන යන්ත්‍රවල (Top loading) බොහොමයක් විට ඇත්තේ කලතන ක්‍රමයයි. එය බලශක්ති කාර්යක්ෂමතාව අඩු කරයි.**



## රෙදි මැදීම

ඇඳුම් සේදීම මෙන් ම මැදීම ද නිවසක නිතිපතා සිදු වන ක්‍රියාවලියකි. ඔබගේ වැරදි භාවිතයන් නිසා විදුලි ස්ත්‍රික්කය අනවශ්‍ය ලෙස ඉහළ යන බව දන්නවා ද? එබැවින් නිවැරදි මැදීමේ ක්‍රම අනුගමනය තුළින් මාසික විදුලි වියදම් අඩු කර බලශක්තිය ඉතිරි කිරීමේ වැඩපිළිවෙළ අද ම ආරම්භ කරන්න.

### විදුලි ස්ත්‍රික්කයක,

- **වාෂ්ප මඟින් රැළි වැටීම් සුමුදු කරයි. එබැවින් ස්ත්‍රික්කයේ ජල පුරවනයට ජලය දමා මැදීම පහසු ය. කාර්යක්ෂම ය.**
- **ස්ත්‍රික්කයේ නො ඇලවෙන සහ මළ නො බඳින පතුලක් පැවතීම මැදීම පහසු කරවයි.**
- **නම්‍යශිලී කේබලය මඟින් එය පරිහරණය පහසු කරයි.**
- **රෙදිපිළි වර්ගය අනුව ගැළපෙන උෂ්ණත්වයක් (විචල්‍ය උෂ්ණත්ව මාපකය) තෝරාගත යුතු ය.**
- **නිවැරදි උෂ්ණත්වයට අනුව ක්‍රියා කරන ස්වයං උෂ්ණත්ව පාලකයක් සහිත ස්ත්‍රික්කයක් රෙදි මැදීම පහසු කර විදුලිය ඉතිරි කරයි.**

එබැවින් විදුලි ස්ත්‍රික්කයක් මිල දී ගැනීමේ දී ඉහත සඳහන් විශේෂාංග එහි පවතී ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වීම වටී.

කෙසේ වෙතත් හැකි සෑම විට ම රෙදි මැදීම අඩුවෙන් සිදු කිරීමට හෝ මැදීම සිදු නො කළ යුතු ඇඳුම් මිල දී ගැනීමට පුරුදු වන්න. අවශ්‍ය සියලු ම ඇඳුම් එක වර මැදගන්න.

ඇඳුම් මැදීමට ප්‍රථම ඒවා වර්ග කරගන්න. එවිට මැදීමට යන කාලය අඩු වීමෙන් විදුලිය ඉතිරි කරයි.

සියුම් රෙදිවලින් අරඹා මැදීමට අපහසු කපු රෙදි දක්වා පිළිවෙළින් රෙදි මැදගන්න. එහි දී පිළිවෙළින් අවශ්‍ය පරිදි උෂ්ණත්වය වැඩි කරගන්න. මැදීමේ පුවරුවේ (අයන් බෝර්ඩ් එකේ) කවරයට යටින් ඇලුමිනියම් කොළයක් අතුරන්න. ඇලුමිනියම් කොළය මඟින් තාපය පරාවර්තනය කිරීම නිසා එකවර දෙපසින් ම රෙදි මැදීම සිදු වේ.

ඝනත්වය වැඩි ඇඳුම් පළමු ව ඇතුළතින් ද දෙවනුව පිටතින් ද මදින්න. ඔබගේ විදුලි ස්ත්‍රික්ක පතුල් පිරිසුදු කිරීමට තියුණු උපකරණ භාවිත නො කරන්න. නැවුම් කෙසෙල් කොළයක් මදින්න. රෙදි මැදීම නතර කරන සෑම මොහොතක ම ස්ත්‍රික්කය සිරස් ලෙස තබන්න.

මේ සරල ඉඟි අනුගමනය තුළින් ඔබගේ එදිනෙදා රෙදි මැදීමේ ක්‍රියාව අර්ථවත් ව හා කාර්යක්ෂම ලෙස සිදු කරගැනීමට හැකි වනු ඇත. විශේෂයෙන් ම ඔබගේ විදුලි බිල අඩු වීමෙන් ඔබේ වියදම් අඩු වනවා පමණක් නො ව රටට ද අනාගත බලශක්ති සංග්‍රාමයට මුහුණ දීමට රුකුලක් ලැබෙනවා නිසැක ය.

**සුදීප ලක්ෂාන්**

**(ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය)**

---

# උෂ්ණත්වය හේතු කොටගෙන කුරුල්ලන්ගේ දේහ ප්‍රමාණය කුඩා වනවා

සාමාන්‍යයෙන් සත්ත්වයකුගේ දේහ විශාලත්වයේ පුළුල් වෙනසක් වීමට පරම්පරා ගණනාවක් ගත වනවා. විශේෂයෙන් ම පක්ෂීන්ගේ ශරීර කොටස් පරිණාමය වීමට අවුරුදු දහස් ගණන් ගත වන අවස්ථා තිබෙනවා.

එහෙත් නවතම අධ්‍යයනයක් පෙන්වා දෙන්නේ උෂ්ණත්වය ඉහළ යෑම හේතු කොටගෙන පක්ෂීන්ගේ ශරීර ප්‍රමාණවල පුළුල් වෙනසක් සාපේක්ෂ ව කෙටි කාලයක දී සිදු වන බවයි. මීට අදාළ අධ්‍යයනය සිදු කරන ලද්දේ එක්සත් ජනපදයේ මිචිගන් විශ්වවිද්‍යාලයේ Benjamin Winger ඇතුළු පිරිස විසින්. මීට අදාළ අධ්‍යයනය පිළිබඳ වාර්තාව *Ecology Letters* ජර්නලයේ පළ වී තිබුණා.



මෙහි දී පර්යේෂකයන් කළේ 1978 සිට 2016 දක්වා වූ වසර 38ක කාලය තුළ කුරුල්ලන් 70,000කගේ දේහ ප්‍රමාණ වෙනස් වීමට අදාළ දත්ත රැස් කිරීමයි. මේ කාලය තුළ (සමස්තයක් ලෙස) පර්යේෂණයට යොදාගත් කුරුල්ලන්ගේ දේහ බර 3%කින් පමණ අඩු වී තිබුණා. පාදවල දිගත් 3%කට ආසන්න ප්‍රමාණයක් අඩු වී තිබුණා.

මෙහි දී පක්ෂීන් බහුතරයක් ලබාගෙන ඇත්තේ මිචිගන් ස්වාභාවික ඉතිහාසය කෞතුකාගාරයෙන්. මේ පක්ෂීන් චිකාගෝහි ගොඩනැඟිලිවල වදිමින් මිය ගිය සතුන්.

මේ කෞතුකාගාරයේ පාලකයන් 1978 සිට ම පුරුද්දක් ලෙස මෙලෙස එකතු කරන සතුන්ගේ බර හා දිග මැන සටහන් කොට තිබුණා.

පසුගිය දශක තුන තිස්සේ චිකාගෝහි උෂ්ණත්වය ක්‍රමික ව වැඩි වී තිබෙනවා.

MR